# ලෝක ජනසංඛ්‍යාව

ලෝක ජනසංඛ්‍යාව යනු - නිශ්චිත කාල සීමාවක් තුළ ලෝකයේ ජීවත් වන මුළු ජනගහන ප්‍රමාණයයි.

ලෝක ජනසංඛ්‍යාව තුළ අපට දැක ගත හැකි ප්‍රධාන ගති ලක්ෂණ 3 ක් ඇත.

01. ජන සංඛ්‍යාවේ විශාලත්වය
02. ජන සංඛ්‍යාවේ වර්ධනය
03. ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය

- ❖ වර්තමානය වන විට ලෝක ජනසංඛ්‍යාව බිලියන 7.5 ට වැඩි අගයක් ගෙන ඇත.
- ❖ ලෝක ජනගහනයේ ඇති වැදගත්කම නිසාවෙන් ලෝක ජනගහන දිනයක් ද ප්‍රකාශයට පත් කර ඇත. එනම් **ජූලි 11 ලෝක ජනගහන දිනයයි.**
- ❖ ලෝක ජනගහනය පිළිබඳ දත්ත, තොරතුරු අපට ලබාගත හැක්කේ වසර 200 කට පමණ කාලයක සිටය.
- ❖ ලෝක ජනගහනයට වසරකට මිලියන 80 ක පමණ ජන සංඛ්‍යාවක් අළුතින් එකතු වේ.
- ❖ ජන සංඛ්‍යාවේ විශාලත්වය මහාද්වීප හා රටවල් අනුව වෙන්කර ගත හැක.
- ❖ ආසියා මහාද්වීපයේ චීනයේ කෝටි 139 ක් ද , ඉන්දියාවේ කෝටි 127 කට ආසන්න ප්‍රමාණයක් ද වාසය කරයි.

# ජන සංඛ්‍යාවේ වර්ධනය

ජන සංඛ්‍යාවේ වර්ධනය යනු - ලෝක ජන සංඛ්‍යාව වැඩි වීමයි. නැතහොත් වැඩිවීමේ සීඝ්‍රතාවයයි.

ජන සංඛ්‍යා වර්ධනය ප්‍රධාන අවධි 2 කි.

01. මන්දගාමී වර්ධනය
02. සීඝ්‍ර ජනගහන වර්ධනය

- ❖ මන්දගාමී අවධියේ දී ජනසංඛ්‍යාව කණ්ඩායම් වශයෙන් ජීවත් වූ අතර, සෞඛ්‍යය පහසුකම් හා අධ්‍යාපන මට්ටම් වල ඇති අඩු බව නිසා මරණ අනුපාතය ඉහළ යාමෙන් අඩු ජන වර්ධනයක් පෙන්නුම් කර ඇත.
- ❖ සීඝ්‍ර ජනගහන වර්ධන අවධියේ දී මිනිසා අධ්‍යාපන මට්ටම අතින් මෙන්ම සෞඛ්‍යය පහසුකම් වල දියුණුව නිසා ජනගහන වර්ධනයේ සීඝ්‍ර වැඩිවීමක් සිදුව ඇත.
- ❖ වර්තමානය වන විට පෘථිවියට දරා ගත නොහැකි මට්ටමක ජනගහනයක් දක්නට ලැබේ.

❖ සංවර්ධිත රටවලට වඩා සංවර්ධනය වෙමින් පවතින රටවල ජනසංඛ්‍යාව වැඩි අගයක් ගනී. එයට හේතුව ලෙස සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින දිළිඳුකම, අඩු අධ්‍යාපනය, සංස්කෘතික බලපෑම, ආර්ථික රටාව, කෘෂිකර්මාන්තය සඳහා ශ්‍රමය බහුලව අවශ්‍ය වීම යන සාධක බලපා ඇත.

## ලෝක ජනගහන ව්‍යාප්තිය

නිශ්චිත භූගෝලීය ඒකකයක් තුළ ව්‍යාප්තව ඇති පැතිරී ඇති ජනගහන ප්‍රමාණයයි.
එම ව්‍යාප්තිය ප්‍රධාන කොටස් 3 ක් යටතේ හඳුනාගත හැක.

1. ජනාධික කලාප
2. මධ්‍යස්ථ කලාප
3. ජනහීන කලාප

## ලෝක ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තියට බලපාන සාධක

01. භෞතික සාධක
02. මානව සාධක

භෞතික සාධක යටතේ සිදුවන්නේ ස්වභාවික පරිසරයේ බලපෑම මත සිදුවන ජනසංඛ්‍යා ව්‍යාප්තියයි.
මානව සාධක යටතේ මිනිසා විසින් භූදර්ශනය තුළ නිර්මාණය කර ඇති දේ මත ජනසංඛ්‍යා ව්‍යාප්තියයි.

## ක්‍රියාකාරකම - 01

01. ලෝක ජනසංඛ්‍යාවේ වර්ධන අවධි 2 නම් කරන්න.
02. එම අවධි වල විශේෂ ලක්ෂණ වෙන වෙනම නම් කරන්න.
03. ලෝක ජනගහන අධික රටවල් 10 ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න.

## ක්‍රියාකාරකම - 02

01. ලෝකයේ ජනාධික කලාප ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න.
02. ලෝක ජනසංඛ්‍යාවේ අසම ජන ව්‍යාප්තියට බලපාන සාධක 3 ක් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
03. ලෝක ජනගහනය අධික ලෙස වැඩිවීමෙන් ඇතිවන ගැටළු මොනවාදැයි උදාහරණ මඟින් පැහැදිලි කරන්න.